**2022 ජනවාරි**
**ජනතා විමුක්ති පෙරමුණේ**
**අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.**

# විමර්ශන

**ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!**




## අර්බුදය අඛණ්ඩව

ලංකාවේ ආර්ථික අර්බුදයට බලපාන ප්‍රධාන හේතුන්ගෙන් එකක් වන ණය අර්බුදය කළමනාකරණය කරගත නොහැකි මට්ටමටටම ළඟා වී ඇත. බලයේ සිටි සෑම ධනපති ආණ්ඩුවක්ම කළ ආකාරයට වත්මන් ආණ්ඩුවට ද කළ හැකි එකම ක්‍රියාමාර්ගය වී ඇත්තේ ණය ගැනීම හා ජාතික සම්පත් විකිණීම ය.

**මේ අර්බුදය දැන් උග්‍ර වී ඇති අතර වර්තමාන ආණ්ඩුව බලයට පත්වූ දින සිට මේ වන විට මාස 21ට රුපියල් බිලියන 4,022 ක ණය ප්‍රමාණයක් ලබාගෙන ඇත. එය මුළු රාජ්‍ය ණය ප්‍රමාණය වන රුපියල් බිලියන 17,052න් හතරෙන් එකකටත් මඳක් වැඩි ප්‍රමාණයකි. ඒ අනුව ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව, කෙටි කලක් ඇතුළත ඉතිහාසයේ වැඩිම ණය ලබා ගත් ආණ්ඩුව බවට පත් වී ඇත.**

| රාජ්‍ය ණය (රුපියල් බිලියන) | | | |
|---|---|---|---|
| විස්තරය | 2019 වසර අවසානයට | 2020 වසර අවසානයට | 2021 සැප්. දක්වා |
| දේශීය ණය | 6,830 | 9,065 | 10,599 |
| විදේශීය ණය | 6,201 | 6,052 | 6,453 |
| මුළු එකතුව | 13,031 | 15,117 | 17,052 |

ඒ අතර විදේශ විනිමය අර්බුදය තව දුරටත් තීව්‍ර කරමින් විදෙස් ශ්‍රමිකයන් විසින් එවනු ලබන ප්‍රේෂණ ප්‍රමාණය අඩු වීමට පටන්ගෙන ඇත. එය පහත වගුවෙන් දක්වා ඇත.

| විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ (ඩොලර් මිලියන) | | | |
|---|---|---|---|
| | 2020 | 2021 | වෙනස |
| ජන - ජුනි | 2,980 | 3,324 | +344 |
| ජුලි - නොවැ | 3,313 | 1,841 | -1,472 |
| එකතුව | 6,293 | 5,165 | -1,128 |
| දෙසැ | 811 | 325 | -486 |
| මුළු එකතුව | 7,104 | 5,490 | -1,614 |

මෙලෙස විදෙස් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ අඩු වීමට හේතු වී ඇත්තේ, විදේශ විනිමය අනුපාතවල ඇති වී තිබෙන ගැටලුකාරී තත්ත්වයයි. වාණිජ බැංකු විසින් ඩොලර් අඩු මිලට ගැනීමත්, අසංවිධිත වෙළෙඳපොළේ දී ඩොලර් වැඩි මිලකට විකිණිය හැකි වීම නිසාත්, 'උණ්ඩියල්' වැනි ක්‍රම හරහා මිනිසුන් තම මුදල් හුවමාරු කරගැනීමෙනුත් මේ තත්ත්වය උදා වී ඇත. එය 2020 වසරේ ජුලි - නොවැම්බර් කාලයට සාපේක්ෂව 2021 වසරේ ජුලි - නොවැම්බර් කාලය තුළ ඩොලර් මිලියන 1,472ක පමණ කඩාවැටීමක් වන අතර, 2021 වසර අවසාන වන විට ඩොලර් මිලියන 1,600ක පමණ පසුගිය වසරට සාපේක්ෂව අඩු විය හැකි බවට ගණන් බලා ඇත.

| විදේශ වෙළෙඳාම (ඩොලර් මිලියන) | | |
|---|---|---|
| | **2020 ජන – සැප්** | **2021 ජන – සැප්** |
| ආනයන | 11,782 | 14,938 |
| අපනයන | 7,445 | 8,934 |
| වෙළඳ ශේෂය | 4,337 | 6,004 |

පසුගිය වසරේ මුල් මාස නවයට සාපේක්ෂව 2021 වසරේ සැප්තැම්බර් වන විට විදේශ වෙළෙඳමේ තත්ත්වය ද ඉතා අවාසිදායක මට්ටමට පත්ව තිබේ. ඒ අනුව මුල් මාස නවයේ වෙළෙඳ ගිණුමේ ශේෂය ඩොලර් මිලියන 6,000ක් පමණ වේ. මේ තත්ත්වයට ප්‍රධාන හේතුව වී තිබෙන්නේ ඉතා විශාල වශයෙන් ආනයන ඉහළ යාමයි.

| ඉදිරි වසර ඇතුලත ගෙවිය යුතු ණය වාරික සහ පොලී (ඩොලර් මිලියන) | |
|---|---|
| නොවැ 2021 - ජන 2022 | 1,332 |
| පෙබ 2022 - සැප් 2022 | 4,669 |
| එකතුව | 6,001 |

මේ සියලු විනිමය අර්බුද තත්ත්වයන් හමුවේ වුව ද, ලංකා රජය නොවැම්බර් සිට ඉදිරි මාස නවයක කාලය තුළ දී ණය සහ වාරික ලෙස ඩොලර් මිලියන 6,000ක් පමණ පහත පරිදි ගෙවිය යුතුය.

මේ අතර විදේශ සංචිතය ද ඉතා දරුණු ලෙස පහළ වැටී ඇති අතර 2020 වසරේ දෙසැම්බර් වන විට තිබු ඩොලර් මිලියන 5,664 ශීඝ්‍රයෙන් අඩු වී අර්බුදය අඛණ්ඩව 2021 නොවැම්බර් වන විට ඩොලර් මිලියන 1,587ක් දක්වා අඩු වී තිබේ.

මේ සියලු කාරණා සැලැකිල්ලට ගත් විට පෙනී යන්නේ ධනපති ක්‍රමයට තව දුරටත් රටේ ආර්ථිකයට ස්ථිර විසඳුමක් ලබාදිය නොහැකි බවයි.

ලෙනින් වරක් පවසා සිටියේ, ධනපති ක්‍රමයේ අර්බුදයෙන් මිදීමට ධනපති පන්තිය ගන්නා උත්සාහය අයෙක් තමන්ගේම සපත්තු පටිවලින් ඇද තමන්වම ඔසවා ගැනීමට උත්සාහ කරනවා වැනිය. යනුයි.

# යටත්විජිත බැම්මෙන් මිදීමට වෙර දරන බටහිර සහරාව

**බටහිර සහරාව අප්‍රිකාවේ පිහිටි අවසන් යටත්විජිතය ලෙස හැඳින්විය හැක. උතුරු අත්ලන්තික් සාගරයටත්, මොරොක්කෝවේ දකුණු ප්‍රදේශයටත්, මොරිටේනියාවේ උතුරු ප්‍රදේශයටත් මායිම්ව එය පිහිටා ඇත. 19 වන සියවස තුළ මෙම භූමි ප්‍රදේශය ස්පාඤ්ඤ පාලනයට නතුව තිබූ අතර, 'සහරාවී ජනතාව' ලෙස පොදුවේ හඳුන්වන ලද නෝමැඩික ගෝත්‍ර මෙහි වාසය කරති. 1975 වසරේ දී ස්පාඤ්ඤය මෙම භූමි ප්‍රදේශය සිය පාලනයෙන් ඒකපාර්ශ්වීය ලෙස අත්හැර දැමුයේ වර්ධනය වන ජාත්‍යන්තර බලපෑම හමුවේය. කෙසේ නමුත්, මෙම අත්හැර දැමීම සිදු කරන ලද්දේ මොරොක්කෝ සහ මොරිටේනියානු හවුල් පරිපාලනයකට බටහිර සහරාවේ පාලනය භාර දෙන රහස් ගිවිසුමකින් අනතුරුවය.**

1975 වර්ෂයේදීම ජාත්‍යන්තර යුක්ති අධිකරණය විසින් උපදේශනාත්මක මතයක් වශයෙන් ප්‍රකාශ කරන ලද්දේ බටහිර සහරාවේ ස්වාධිපත්‍යය සම්බන්ධයෙන් මොරිටේනියාවට හෝ මොරොක්කෝවට හෝ බැඳියාවක් නොමැති බවත්, ස්වයංතීරණ අයිතිය ලබා ගැනීමට සහරාවී ජනතාවට නීත්‍යානුකූල අයිතියක් ඇති බවත්ය. මොරොක්කෝවත් මොරිටේනියාවත් බටහිර සහරාව ආක්‍රමණය කිරීම මෙම සමයෙහිදී ආරම්භ කළ අතර 21,000කට අධික පිරිසකට දිවි අහිමි කළ එමෙන් දෙතුන් ගුණයක පිරිසක් අවතැන් කළ 15 වසරක යුද්ධයක ආරම්භය එය විය. මෙම යුද්ධය හමුවේ බටහිර සහරාවේ භූමිය සහ ජනතාව වෙනුවෙන් සටන් කළේ සහ වර්තමානයේ පවා ඒ වෙනුවෙන් අරගල කරනු ලබන්නේ 'සහරාවී විමුක්ති ව්‍යාපාරයයි' (POLISARIO Front). 1979 පමණ වන විට මෙකී යුද්ධයෙන් මොරිටේනියාව ඉවත්වූ නමුත්, මොරොක්කෝව වර්තමානය දක්වා බටහිර සහරාවේ තුනෙන් දෙකක පමණ සාරවත්ම ප්‍රදේශයක් යටත් කරගෙන සිටී. එසේම බිම් බෝම්බවලින් පිරවූ වැලි පවුරකින් මොරොක්කෝ පාලන ප්‍රදේශය අනෙක් ප්‍රදේශවලින් වෙන්කර තිබේ. යටත් කර නොගත් ප්‍රදේශ ජීවත්වීමට නුසුදුසු තත්ත්වයක පැවැතීමත්, අඛණ්ඩ යුද්ධය නිසා පලා යාමට සිදු වීමත් හේතුවෙන් ඇල්ජීරියාවට ආසන්න සහරා කාන්තාර ප්‍රදේශයේ සරණාගත කඳවුරුවල සහරාවී ජනතාව විශාල පිරිසක් ජීවත් වෙති.

1991දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීමෙන් සටන් විරාමයක් ඇති කරන ලදී. ඒ අනුව 'මිනුර්සෝ' (MINURSO) නමින් එක්සත් ජාතීන්ගේ ව්‍යුහයක් ස්ථාපනය කරනු ලැබුවේ මෙම සටන් විරාමය අධීක්ෂණය කිරීමේ සහ බටහිර සහරාවේ අනාගතය සම්බන්ධයෙන් මතය විමසීම සඳහා ජනමත විචාරණයක් පැවැත්වීමේ අරමුණද සහිතවය. 1999දී මේ සඳහා ඡන්ද හිමි නාමලේඛනයක්ද ප්‍රකාශයට පත් කළ නමුත්, මෙවැනි ජනමත විචාරණයක් මේ දක්වා පවත්වා නැත. දශක ගණනාවක් තිස්සේ බටහිර සහරාවේ ජනතාවට මොරොක්කෝව විසින් යටත් කර ගත් ප්‍රදේශවල, සරණාගත කඳවුරුවල සහ වෙනත් රටවල ජීවත්වීමට සිදුව ඇත්තේ තමන්ගේම කියා රටක හුස්ම ගැනීමට ඉඩක් නැතිවය. මෙලෙස ජීවත් වන ජනතාවගේ දැඩි මානව හිමිකම් උල්ලංඝනය වීම් පමණක් නොව සිය මවුභූමියේ සම්පත් සූරාකෑමද අත්විඳීමට සිදුවී ඇත. මොරොක්කෝව දැඩි ලෙස බටහිර සහරාවේ සාරය සූරාකමින් සිටී. සරණාගත කඳවුරු පිළිබඳව සලකන විට ඒවායේම ඉපදී, හැදී වැඩුණු 1,00,000කට අධික සහරාවී පරපුරක්ද ඒවා තුළ ජීවත් වෙති.




බටහිර සහරාවේ භූමිය වෙරි තක්කලි වගාව සඳහා ප්‍රකටය. නමුත්, මෙම වගාවලින් ලාභය ලබාගන්නේ මොරොක්කෝවයි. එපමණක් නොව වැලි, ෆොස්පේට් වැනි ඛනිජ වර්ගද මොරොක්කොව විසින් අවභාවිත කරනු ලබන අතර, ධීවර සම්පත්ද මොරොක්කෝව සිය අයිතියට නතු කරගෙන සිටී. බටහිර සහරා භූමියේ සුළං ශක්තිය පුනර්ජනනීය බලශක්ති ක්‍රමයක් වශයෙන් භාවිත කරන්නේද මොරොක්කෝවයි. බටහිර සහරාවේ ස්වයංතීරණ අයිතිය සහ ස්වාධිපත්‍යය ඇති කරගැනීම උදෙසාවූ මෙම ජනමත විචාරණයට දිගින්දිගටම බාධා පමුණුවන මොරොක්කෝව පසුගිය වසරක පමණ කාලයක සිට සටන් විරාම කොන්දේසි උල්ලංඝනය කරමින් සහරාවී ජනතාව සහ දේශපාලන ක්‍රියාධරයන් මර්දනය සිදුකරන බව නිරීක්ෂණය කළ හැකිය.

සහරාවී ජනතාවට මුහුණ දීමට සිදුවී ඇති ඛේදවාචකය මානව ඉතිහාසයේ මනුෂ්‍යත්වයට එරෙහි දරුණුතම අපරාධවලින් එකක් ලෙස සැලකිය හැකිය. මොරොක්කෝව සහ බටහිර සහරාව අප්‍රිකානු මහද්වීපයේ පිහිටා ඇතත්, යුරෝපා කලාපයට අතිශය ආසන්නව පිහිටා තිබේ. යුරෝපා සංගමයට සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයට සැලකිය යුතු බලපෑමක් මොරොක්කෝවට සිදුකරමින් බටහිර සහරාවේ ස්වයංතීරණ අයිතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා අනිවාර්ය වශයෙන් මැදිහත්වීමේ හැකියාව ඇතත්, එම වගකීම නොසලකාහරින බව දක්නට ලැබේ. යුරෝපා සංගමයේ මෑත ක්‍රියාකාරීත්වය සලකන විට එය නේටෝව හා එක්වී යුරෝපය තුළ යුද ශක්තිය අතින් බලවත් යාන්ත්‍රණයක් ඇති කරගැනීමට උත්සුක වීම විනා මානුෂීය මෙහෙවරක වගකීම ගැනීමට උත්සුක වන ස්වභාවයක් දක්නට නොලැබේ. තවද, මොරොක්කෝව විසින් සිදුකරනු ලබන බටහිර සහරාව සූරාකෑමේ ක්‍රියාවලියට විවිධ සමාගම් හරහා යුරෝපා සංගමය සහාය දක්වන බවද නිරීක්ෂණය වී තිබේ. එනයින් එකී සංවිධානවල අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයේ ස්වභාවයද හෙළිදරව් කෙරේ.

සහරාවී විමුක්ති ව්‍යාපාරය හෙවත් POLISARIO Front සහ එහි තරුණ අංශය වන UJSARIO සංවිධානය ජාත්‍යන්තර අධිරාජ්‍ය විරෝධී, ප්‍රගතිශීලී මෙන්ම වාමාංශික සංවිධාන සමඟද සමීපව කටයුතු කරමින් බටහිර සහරාව නිදහස් සහ ස්වෛරී රටක් වශයෙන් නැවත සහරාවී ජනතාව වෙත දිනා ගැනීමේ අරගලයක යෙදී සිටී. ඒ වෙනුවෙන් ලෝක සාම මණ්ඩලය, ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය මෙන්ම ලොව අධිරාජ්‍ය විරෝධී, ප්‍රගතිශීලී සහ වාමාංශික සංවිධාන විශාල ප්‍රමාණයක් සහයෝගය ලබාදීම සහ ඒ වෙනුවෙන් හඬනැගීමද සිදුකරනු ලබයි.

**1977 දී ප්‍රකාශයට පත්කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ විප්ලවීය ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින්ද විදේශ ප්‍රතිපත්ති ක්ෂේත්‍රය යටතේ අනෙකුත් කරුණු අතර බටහිර සහරාවේ ජනතාවගේ අරගලය වෙත සහාය පළ කර ඇත.**

**"මොරොක්කෝ - මවුරිතානියා ආධිපත්‍යයෙන් සහරාව නිදහස් කරගැනීමෙහිලා පොලිසාරියෝ සංවිධානයේ අරගලයටත්, එවැනි අන් ඕනෑම සාධාරණ අරගලයකටත් කොන්දේසි විරහිත ක්‍රියාත්මක සහාය පළ කරනු ලැබේ."**



# වායු බලශක්ති ප්‍රභව

**මිනිසා විසින් භාවිතා කරනු ලබන ස්වභාවික බලශක්ති ප්‍රභව අතර වායු වර්ග ද ගණනාවක් ඇත. මෙහිදී මූලික වශයෙන් සිදුවන්නේ පරමාණු අතර ඇති බන්ධන බිඳිමින් නව බන්ධන සාදමින් ශක්තිය පිටකිරීම යි. එය බොහෝවිට වායු දහන ක්‍රියාවලික්, එනම් ඔක්සිජන් සමග ප්‍රතික්‍රියා කිරීමක් විය හැක. එලෙස බලශක්තිය නිපදවීමට යොදාගන්නා නිතර සංවාදයට බඳුන්වන වායු කාණ්ඩ කිහිපයක් පිළිබඳ තොරතුරු මෙහිදී සාකච්ඡා කරමු.**

## LP ගෑස් (Liquefied Petroleum Gas)

ද්‍රව තත්වයට පත්කරන ලද වායු වර්ග කිහිපයක් මේ වර්ගීකරණයට අයත්වේ. ප්‍රොපේන් ($C_3H_8$), බියුටේන් ($C_3H_8$), ප්‍රොපිලේන් ($C_3H_6$) ඒ අතරින් ප්‍රමුඛ වේ. වාහන, ආහාර පිසීම, තාපය නිපදවන උපකරණ ආදිය සඳහා මෙම වායූන් බොහෝවිට භාවිතා වේ. ශීතකරණ ආදී උපකරණ සඳහා භාවිතා කෙරෙන ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් (CFC) මගින් ඕසෝන් ස්ථරයට හානි සිදුවන බැවින් ඊට විකල්පයක් ලෙසද වර්තමානයේ LP ගෑස් වර්ග භාවිතා කරනු ලබයි.

මින් බහුල වශයෙන් භාවිතා කරනු ලබන්නේ ප්‍රොපේන් සහ බියුටේන් වන අතර ඒවා එකිනෙක මිශ්‍ර කිරීම හරහා ද භාවිතා කරනු ලබයි. විශේෂයෙන් උතුරු අර්ධගෝලයේ රටවල ශීත කාලයේදී වැඩි ප්‍රතිශතයක් ලෙස ප්‍රොපේන් භාවිතා කරන අතර ග්‍රීෂ්ම කාලයේදී වැඩි ප්‍රතිශතයක් ලෙස බියුටේන් භාවිතා කරයි. එය සාමාන්‍යයෙන් ශීත කාලයේදී ප්‍රොපේන් 80%ට බියුටේන් 20%ක් පමණ ද ග්‍රීෂ්ම කාලයේදී ප්‍රොපේන් 40%ට බියුටේන් 60% පමණ ද වේ. මීට හේතුව වන්නේ ප්‍රොපේන්හි තාපාංකය -420C පමණ වීමත් බියුටේන්හි තාපාංකය -40C පමණ වීමත් ය. LP ගෑස් වර්ගවල ස්කන්ධය සාමාන්‍ය වාතයට වඩා ඉහළ අගයක් ගන්නා බැවින් ගෑස් කාන්දුවකදී නිකුත්වූ ගෑස් ඉහලට ගමන් නොකර පොළව ආසන්නයේ පිහිටයි.

වෙළඳපොළේදී ප්‍රොපේන් හී මිල බියුටේන්වලට සාපේක්ෂව 5%-10% පමණ ඉහල අගයක් ගනී. ලොව පුරා වාර්ෂික LP ගෑස් ඉල්ලුම මෙට්‍රික් ටොන් මිලියන 280 ඉක්මවන අතර නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 300කට ආසන්න අගයක් ගනී.

## LNG (Liquefied Natural Gas)

මීතේන් ($CH_4$), එතේන් ($C_2H_6$) වැනි ද්‍රව තත්වයට පත්කරන ලද වායුවර්ග මෙම වර්ගීකරණයට අයත්වේ. මින් ප්‍රධාන වන්නේ මීතේන් වේ. මේවා ගන්ධය රහිත, අවර්ණ මෙන්ම විෂ සහිත ද නොවේ. අනෙකුත් ඉන්ධන මෙන්ම මේවාද පොළව අභ්‍යන්තරයේ පවතින නිධි කැණීම් හරහා නිෂ්පාදනය කරනු ලබයි.







LNG ප්‍රධාන වශයෙන් යන්ත්‍ර පණගන්වන ඉන්ධනයක් ලෙස භාවිතා වේ. එසේම ආහාර පිසීම, තාපය නිපදවීම, විදුලිය නිපදවීම ආදිය මෙන්ම පොහොර නිෂ්පාදනය, තීන්ත නිෂ්පාදනය ආදී දේ සඳහා ද මේවා භාවිතා වේ. වාහන සඳහා ඉන්ධනයක් ලෙස, විශේෂයෙන් බර වාහන සඳහා LNG අද ලොව පුරා ප්‍රචලිත වෙමින් ඇත. පෙට්‍රල් හෝ ඩීසල් තරම් ශක්තිය නිපද නොවුවද අධික බලයක් සහිත එන්ජිම් ක්‍රියාකරවීම සඳහා අද වන විට පෙරමුණ ගනිමින් ඇත්තේ LNG ය.

1970දී ඝන මීටර් බිලියන 3ක් පමණ වූ LNG වෙළඳාම 2011 වන විට ඝන මීටර් බිලියන 331ක් දක්වා ඉහළ ගොස් තිබුණි. පසුගිය දශක 2 තුල සෑම වසරකටම 7%ක පමණ ප්‍රමාණයකින් LNG භාවිතය වර්ධනය වී ඇත. එසේම වර්තමානයේ බොරතෙල් ආශ්‍රිත නිෂ්පාදනවලින් 10%ක පමණ කොටසක් LNG විසින් අත්පත් කරගෙන ඇත.

භූගත ඉන්ධන අතරින් දහනයේදී අවම කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයක් බැහැර කරනු ලබන ඉන්ධන වර්ගය වන්නේ LNG ය. පෙට්‍රල්වලට සාපේක්ෂව කාබන්ඩයොක්සයිඩ් මුදාහැරීම 30%ක් අඩු අතර ගල්අඟුරුවලට සාපේක්ෂව එය 45%ක් අඩු ය.

7 පිටුවට

# ග්‍රීක ශිෂ්ටාචාරයේ විශේෂතා (පසුගිය කලාපයේ ඉතිරි කොටස)

ලොව පැරැණි ශිෂ්ටාචාරවලට සාපේක්ෂව බොහෝ ක්ෂේත්‍රවල විශාල වර්ධනයක් අත්පත් කර ගැනීමට ග්‍රීක ශිෂ්ටාචාරය සමත් වී තිබේ. වහල් හිමි පන්ති සමාජ ක්‍රමයක් පැවැතීම තුළ සෘජුව ම නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ නොවුණු පිරිසකගේ පැවැත්මට සාපේක්ෂ ඉඩකඩ පුළුල් විය. කලාව, සාහිත්‍යය, විද්‍යාව, දර්ශනය වැනි ක්ෂේත්‍ර වෙනමම විෂයයන් ලෙස වර්ධනයට ඉන් ඉඩක් ලැබුණු අතර, ඒ වෙනුවෙන් වෙන්වූ පිරිසක්ද ග්‍රීසිය තුළ බිහි විය. පෙරික්ලස් යුගය තුළ මෙම දියුණුව කැපීපෙනෙන තත්ත්වයක් ඇති විය.

**ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව, චිත්‍ර ශිල්පය සහ නාට්‍ය කලාව**

- ✧ පර්සියානු ආක්‍රමණවලින් පසු ග්‍රීසිය නැවත ගොඩනැඟීමේ දී කිරිගරුඬ භාවිත කර තිබේ.
- ✧ විශේෂයෙන් කඳුගැටයක් මත 'ඇක්‍රොපොලිස්' නම් නගරය ඉදිකිරීම, ඇතීනා දෙවඟන වෙනුවෙන් 'පාතිනන්' දේව මැඳුර ඉදිකිරීම මේ අතර විශේෂ වෙයි. දීප්තිමත් වර්ණ යොදා අඳිනු ලැබූ චිත්‍රවලින් මෙම ගොඩනැගිලි අලංකාර කර තිබීමද විශේෂත්වයකි. ඇතැන්ස්හි සුප්‍රසිද්ධ ගෘහ නිර්මාණකරුවා වූයේ **ඉක්ටිනුස්**ය. මූර්ති ශිල්පියා වූයේ **පිඩියාස්**ය.

මයිරන්ගේ නිර්මාණයක්වූ කවපෙත්ත විසිකරන්නාගේ මූර්තියෙන් ග්‍රීක මලල ක්‍රීඩකයන්ගේ ජවසම්පන්නභාවයත්, තීක්ෂණ දැක්මත් මනාව විදහා දැක්වේ.

**චිත්‍ර ශිල්පී ඇපලෝ ඩෝරස් විසින්** ආලෝකය සහ අඳුර චිත්‍ර ශිල්පයේදී භාවිතයට ගන්නා ආකාරය පිළිබඳවත්, යථාර්ථවාදී සිතුවම්කරණය පිළිබඳවත් හඳුන්වා දෙනු ලැබීය.

ඊජිප්තු ශිෂ්ටාචාරයේ දක්නට ලැබෙන සංකේතාත්මක චිත්‍ර ශෛලියට සාපේක්ෂව ග්‍රීක චිත්‍ර ස්වාභාවිකත්වවාදී ලෙස ඇඳ තිබීමත්, භාවාත්මක විදහා දැක්වීම් ඉතා තියුණු ලෙස ඉදිරිපත් කර තිබීමත් සුවිශේෂී වෙයි.

මෙම කාලයේදීම නාට්‍ය කලාවද දියුණු විය. නූතන නාට්‍ය කලාව බිහිවන්නේ පෙරික්ලස්ගේ යුගයේදීය. මෙම නාට්‍ය සම්ප්‍රදායය බිහිවීමට පෙර සියවස් ගණනාවක් ග්‍රීසියේ ආගමික උත්සව තුළ ගීතිකා කණ්ඩායම් පමණක් භාවිතයට ගනු ලැබිණි. මේවා තුළ වයින් පානයට අධිපති දෙවියා (God of Wine) සේ සැලැකූ ඩිබිනියස් වෙනුවෙන් සිදු කරන ලද උත්සවවලදී මෙම සරල ඉදිරිපත් කිරීම් නාට්‍ය ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම තුළ නාට්‍ය කලාව සඳහා පදනම වැටිණි.

- ✧ මැරතන් යුද්ධයට සම්බන්ධවූ දක්ෂ විශ්‍රානවාදියකුවූ එස්කිලන් (ක්‍රි.පූ. 525-456) ග්‍රීක මිථ්‍යා කතාවල එන දෙවිවරුන් සහ වීරයන් පසුබිම් කරගෙන වේදාන්ත රචනා කළේය.
- ✧ ක්‍රිස්තු පූර්ව (496-406) කාලයේ විසූ සොෆොක්ලිස්ද මහා නාට්‍යකරුවෙකි. 'ඇන්ටිගනී', 'ඉලෙක්ට්‍රා', 'ඊඩිපස් රෙක්ස්' ඔහුගේ මහා කාව්‍ය ත්‍රිත්වයයි.
- ✧ ක්‍රිස්තු පූර්ව (440-380) කාලයේ සිටි ඇරිස් ටොපේක්ස්ද ප්‍රහසන නාට්‍ය කලාවේ ප්‍රවීණයෙකි. 'නයිට්ස්', 'වලාකුළු', 'මැන්ඩූකයෝ' ඔහු විසින් රචනා කරන ලද ප්‍රධානතම උපහාසාත්මක නාට්‍ය ත්‍රිත්වයයි.

**විද්‍යාවේ සහ දර්ශනයේ පිබිදීම**

**පෙරික්ලස්ගේ යුගය ඉතිහාසඥයන් හඳුන්වන්නේ ප්‍රශ්න කිරීමේ යුගය වශයෙනි.**

ග්‍රීක චින්තකයන් නිරන්තරයෙන්ම ඇසූ ප්‍රශ්න දෙක වූයේ:

1. යම් යම් දේවල් සිදුවන්නේ ඇයි?
2. ඔවුන්ට ඕනෑ ඕනෑ ආකාරයට මිනිසුන් හැසිරෙන්නේ ඇයි?

මෙකල වර්ධනයවූ බොහෝ විද්‍යාත්මක සොයාගැනීම්වල සහ දාර්ශනික මතවල පදනම වූයේ මෙම ප්‍රශ්නවලට ලබා දෙන ලද පිළිතුරු මත ගොඩනැගෙන අදහස්ය.

- ✧ කාය වෛද්‍යවරයකුවූ හිපොක්‍රටිස් සහ ඔහුගේ අනුගාමිකයෝ රෝග සඳහා බලපාන ස්වාභාවික භෞතික හේතු අධ්‍යයනය කළහ.
- ✧ ප්‍රසිද්ධ දේශනා පැවැත්වීමට තරුණයන් පුහුණු කිරීම සඳහා සොෆිස්ට්වාදීහු පෞද්ගලික ගුරුවරුන් ලෙස කටයුතු කළහ. මොවුන් විසින් දෙවිවරුන්ගේ පැවැත්ම විවෘතව ප්‍රශ්න කරනු ලැබිණි. සුප්‍රසිද්ධම දාර්ශනිකයන් තිදෙනා වූයේ සොක්‍රටීස්, ප්ලේටෝ සහ ඇරිස්ටෝටල්ය.
- ✧ බටහිර ලෝකයේ මහා ඉතිහාසඥයා වූයේ **හෙරඩෝටස්**ය. ග්‍රීකයන් සහ පෙරදිග ජාතීන් අතර සබඳතා වාර්තාගත කළේ හෙරඩෝටස්ටය. ඔහු බැබිලෝනියාව, කිර්ගීසියාව සහ මිසරය වැනි රටවල සංචාරය කර ඇත.

# හෙලනිස්තික ශිෂ්ටාචාරය




## 1. හැඳින්වීම:

**ක්‍රිස්තු පූර්ව 336දී මැසිඩෝනියාවේ පාලකයාවූ පිලිප් රජුගේ මරණින් පසු බලයට පත්වූ ඔහුගේ පුත් ඇලෙක්සැන්ඩර් යටතේ අධිරාජ්‍යය තවදුරටත් පුළුල් විය. ක්‍රිස්තු පූර්ව 324 වන විට ඇලෙක්සැන්ඩර්ගේ අධිරාජ්‍යය යටතට මැසිඩෝනියාව, ග්‍රීසිය, උතුරු ඉන්දියාව, පර්සියාව, ඊජිප්තුව සහ සුළු ආසියාව යන රාජ්‍යයන් අයත් විය.**

**මෙම අධිරාජ්‍යයේ නැඟීමත් සමඟ ග්‍රීක සභ්‍යත්වය ආසියානු සංස්කෘතික ලක්ෂණ සමඟ මුසුවීමෙන් බිහිවුණු නව ශිෂ්ටාචාරය හඳුන්වනු ලබන්නේ හෙලනිස්තික ශිෂ්ටාචාරය නමිනි. ලෝක ශිෂ්ටාචාර අතුරින් හෙලනිස්තික ශිෂ්ටාචාරය වැදගත්කමින් අඩු නැතහොත්, ග්‍රීක ශිෂ්ටාචාරයේම උප සභ්‍යත්වයක් යැයි බොහෝ දෙනකුගේ මතය වී තිබුණත්, සාමාන්‍යයෙන් ශිෂ්ටාචාරයක් හඳුනා ගැනීමේ දී භාවිත කරනු ලබන නිර්ණායක අනුව ගත් විට 'හෙලනිස්තික සභ්‍යත්වය' ශිෂ්ටාචාරයක් ලෙස හඳුනා ගත හැකි බවට ඉතිහාසඥයන් විසින් පිළිගෙන තිබේ.**

ඇලෙක්සැන්ඩර් යටතේ විශාල ප්‍රදේශයක් පුරා අධිරාජ්‍යය ව්‍යාප්තව පැවැතීම හේතුවෙන් එම ප්‍රදේශවලින්ද සම්පත් ගලා ඒමත් සමඟ හෙලනිස්තික යුගයේ ආර්ථිකය ශීඝ්‍රයෙන් වර්ධනය විය.

## 2.හෙලනිස්තික සමාජය

### 2.1. හෙලනිස්තික යුගයේ ආර්ථිකය

ග්‍රීක පෞර රාජ්‍ය ස්වාධීන දේශපාලන ඒකක වශයෙන් ක්‍රියාත්මකවූ කාලයේදී ඒවාටම ආවේණිකවූ ආර්ථිකයන් තිබිණි.

ඊජිප්තුව හා සුළු ආසියාව අතර ග්‍රීකයන්ගේ වෙළෙඳම දියුණුවීමත් සමඟ පෙරදිග වෙළෙඳ භාණ්ඩ ග්‍රීසියට විශාල වශයෙන් ඇදී ආවේය. ඇතැන්ස් හා කොරින්ත් වැනි ප්‍රධාන පෙළේ වෙළෙඳ මධ්‍යස්ථානවල වැදගත්කම ක්‍රමයෙන් අහෝසිවී ගිය අතර, ඒ වෙනුවට ඇලෙක්සැන්ඩ්‍රියාව, ඇන්ටියොක් සහ රොඩ්ස් ප්‍රමුඛ වෙළෙඳ නගර බවට පත් විය. ඇලෙක්සැන්ඩ්‍රියාව සහ ඇන්ටියොක් වැදගත් කාර්මික හා වාණිජ මධ්‍යස්ථාන දෙකක් බවට පත් විය. රොඩ්ස් වැසියෝ හෙලසනිස්තික

# මානව ශිෂ්ටාචාරයේ විකාශනය - 08 කොටස

ලෝකයේ ජාත්‍යන්තර බැංකුකරුවන් ලෙස ක්‍රියා කර ඇත.

### 2.2. හෙලනිස්තික සමාජ ක්‍රමය

හෙලනිස්තික සමාජයද ග්‍රීසිය මුල් කරගත් වහල් සමාජ ක්‍රමයකි. ඉතාමත් තියුණු පන්ති බෙදීමක් තිබූ මෙම සමාජ ක්‍රමය තුළ අතුරු පන්ති හා ස්ථර අතරද බරපතල විෂමතාවක් වර්ධනය විය. හෙලනිස්තික යුගයේදී මෙම විෂමතාව තවදුරටත් වර්ධනය වූයේ වෙළෙඳාමත් සමඟ කර්මාන්තවල ශීඝ්‍ර වර්ධනය හේතුවෙනි. ඊජිප්තුව තුළ ව්‍යාපාරවල නියුතු අය සහ නිලධාරීන් ධනවත්වූ අතර, පාරාවරුන්ගේ යුගයේ සිටම බදු බරින් පීඩාවට පත් ගොවියෝ තවදුරටත් දුප්පත් වූහ. ග්‍රීක පෞර රාජ්‍යවල තත්ත්වයද මීට සමාන්තර විය. මේ සමඟම සමස්ත හෙලනිස්තික සමාජයම (වහල් ක්‍රමය සහිත) ගැටලු රැසකට මුහුණ දුන්නේය.



### 3. අධිරාජ්‍යය බිඳවැටීම

ක්‍රිස්තු පූර්ව 323දී සිදුවූ ඇලෙක්සැන්ඩර් රජුගේ මරණින් පසු අධිරාජ්‍යය කොටස්වලට බිඳී ගියේය. ඉතා විශාල ප්‍රදේශයක් පුරා පැතිර තිබීමත්, අසංවිධානාත්මකභාවයත්, ඔහුගේ හමුදා නායකයන් යුද මෙහෙයුම් ගණනාවක නිරතව සිටීම නිසාත් යටත් කර ගත් ප්‍රදේශ පාලනය කිරීම දුර්වල විය. මෙහි ප්‍රතිඵලය වූයේ අධිරාජ්‍ය පාලකයන් තිදෙනකු යටතේ රාජධානිය කොටස් තුනකට බෙදී යාමයි.

1. ඊජිප්තුව - ඇලෙක්සැන්ඩර් රජුගේ සෙනෙවියකුවූ ටොලමිගේ පාලනයට නතු විය.
2. මැසිඩෝනියාව (ග්‍රීසියේ කොටසක්ද සහිතව - ඇන්ටිගෝනස්ගේ පාලනයටද,
3. බටහිර ආසියාව - මෙලියුකන්ගේ පාලනයටද නතු විය.

### 4. හෙලනිස්තික සමාජයේ විශේෂතා

මෙම නව ග්‍රීක - පෙරදිග ශිෂ්ටාචාරය තුළ කලාව, සාහිත්‍යය, විද්‍යාව සහ දර්ශනය යන ක්ෂේත්‍රයන්ද විශේෂ වෙනස්කම්වලට ලක් විය. හෙලනිස්තික යුගය ග්‍රීක පරිහානි යුගය ලෙස සලකනු ලැබේ. මෙය දාර්ශනික වශයෙන්ද පරිහානි යුගයක් විය. ග්‍රීසිය බිඳවැටීම තුළවූ පරාජිත හැඟීම් එම යුගයේ බිහිවූ දර්ශනයන් තුළින්ද පිළිබිඹු විය.

### 4.1. විද්‍යාව, දර්ශනය සහ ශාස්ත්‍රීය වර්ධනය

■ **දර්ශනයඃ**

හෙලනිස්තික යුගයේ බිහිවූ දර්ශනයන් වසර ගණනාවක් යන තුරු බටහිර චින්තනයට බලපෑමක් ඇති කරනු ලැබීය. දර්ශනය පිළිබඳව ඒ වන විටත් ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණේ, ඇතැන්ස් පුරවරයයි. හෙලනිස්තික යුගයේ විසූ දාර්ශනිකයන් මානව පැවැත්ම, මිනිසාගේ ආචාරශීලීත්වය හා ලෞකික ගුණධර්ම වර්ධනය මුල්කර ගත් අදහස් ඉදිරිපත් කිරීමත් සමඟ නව චින්තන ගුරුකුලයක්ද බිහි විය. මෙම යුගයේ ප්‍රධාන දාර්ශනික ගුරුකුල තුනක් දක්නට ලැබේ.

**I. සිනෝගේ මූලිකත්වයෙන්වූ ගුරුකුලය (ස්ටොයික්වරුන්)**

සිනෝ යනු ක්‍රිස්තු පූර්ව 340-265 අතර කාලයේ සයිප්‍රසයේ, සිටියම්හි ඉපැදුණු පුද්ගලයෙකි. ග්‍රීක දර්ශනය ඉගෙන ගත් ඔහු ඉන් සෑහීමකට පත් නොවී ක්‍රිස්තු පූර්ව 300දී පමණ 'ස්ටොයික්වාදය' නම් ගුරුකුලය ආරම්භ කළේය. 'ස්ටොයික්වාදය' යන වචනය තැනී ඇත්තේ, 'විවිධ වර්ග අලේප කළ පෝටිකෝවක්' යන අර්ථය ගෙන දෙන 'ස්ටෙආ' (Stea) යන වචනයෙනි. ඔහු දේශනා පැවැත්වූයේ එවැනි අලංකාර ස්ථානයක සිට බැවින්, ඔහුගේ දර්ශනයට එම නම ලැබී තිබේ. ආචාරශීලී මිනිසා සතුට හා දුක නොවෙනස්ව, උපේක්ෂාසහගතව භාර ගත යුතු බවත්, එවිට අවසනාවන්ත අත්දැකීම්වලට ධෛර්යවත්ව මුහුණ දිය හැකි බවත් ස්ටොයික්වාදීන්ගේ අදහස විය. විශ්වය මෙහෙයවන්නේ දිව්‍යමය බලපෑමක් මත බැවින්, එහි ක්‍රියාකාරීත්වය නිවැරැදි බවත්, ඊට එරෙහිව පැමිණිලි නොකළ යුතු බවත් විශ්වාස කරනු ලැබීය. පසුකාලීනව මෙම දර්ශනය රෝමය හා ක්‍රිස්තියානි මූලධර්මය කෙරෙහි බෙහෙවින් බලපා තිබේ.

**II. එපිකියුරස් (එපිකියුරින්වාදය)**

ක්‍රිස්තු පූර්ව 342දී පමණ එමෝස් නගරයේ ඉපැදුණු ඔහු ක්‍රිස්තු පූර්ව 306දී ඇතැන්ස් පුරවරයට පැමිණ භෞතිකවාදී නව දාර්ශනික කණ්ඩායමක් පිහිටුවනු ලැබීය. එපිකියුරස්ගේ දර්ශනය අනුව සතුට යනු ඉන්ද්‍රියයන් පිනැවීම ඉක්මවා යන සතුටකි. එය ලෝකය, සමාජය, මිනිසා, ශරීරය හා චින්තනය පිළිබඳ භෞතිකවාදී අවබෝධයකින් ගලා එන්නකි. නොපෙනෙනන බලවේග තමා පාලනය නොකරන බව දැනගැනීම නිසා ඇතිවන නිදහසත්, දෙවියන්ට ඇති බිය නැතිවීම නිසා එන සැහැල්ලුවත් සහිත සතුටකි. මෙම දර්ශනය වසර 600ක් පමණ යුරෝපයේ පැවැති අතර, ක්‍රිස්තියානි ආගමේ නැඟීමත් සමඟ යටපත් විය.

**III. ඩයෝජිනිස් (සයිනික්වාදය - නරුමවාදය)**

මානව සංස්කෘතියට එරෙහිව යළි සොබාදහම වෙත යාම සිය දර්ශනය කර ගත් ඩයෝජිනිස් සුනඛයකු මෙන් ජීවත් විය. ඇඳුම් ඇන්දේ නැත. ආහාර ගත්තේත්, වතුර පානය කළේත් සුනඛයකු මෙනි. එම නිසාම ඔහු 'සුනඛයා' යන අරුත දෙන 'සයිනික්' (Cynic) නමින් ප්‍රකට විය. පුරාවෘත්තවලට අනුව ඔහු ජීවත්වූයේ පීප්පයකය. ඇතැම් විචාරකයන් අදහස් කරන්නේ එය මිනී වැළලීම පිණිස භාවිත කළ විශාල කළයක් බවයි. ඩයෝජිනිස් විග්‍රහ කළේ 'සද්ගුණය' ගැනය. දිනක් මහා ඇලෙක්සැන්ඩර් අධිරාජයා ඔහු බැලීමට යන විට ඩයෝජිනිස් හිරුරැස් නාමින් සිටියේය. ඔහුගේ කැපවීම පිළිබඳව පැහැදුණු ඇලෙක්සැන්ඩර් රජු ඔහුට අවශ්‍ය ඕනෑම දෙයක් ඉල්ලා සිටින ලෙස පවසා ඇත. ඩයෝජිනිස් පවසා ඇත්තේ, හිරු එළිය මුවා නොකර එතැනින් ඉවත්වීම ප්‍රමාණවත් බවයි. ඉතාමත් උද්‍යෝගීමත් දාර්ශනිකයකුවූ ඔහු ප්‍රීති ප්‍රමෝදයෙන් යුතුව ලෝකයට මුහුණ දුන් අවසන් ග්‍රීක දාර්ශනිකයා ලෙස සැලැකේ. ක්‍රිස්තු පූර්ව 300දී පමණ වන විට ඇලෙක්සැන්ඩ්‍රියාව තුළ සයිනික්වාදය විලාසිතාවක් බවට පත් විය.

■ **විද්‍යාව**

මෙම යුගයේ විද්‍යාත්මක වර්ධනයේ පදනම වූයේ ගවේෂණය, පරීක්ෂණය, අධ්‍යයනය හා ප්‍රායෝගිකත්වය යන කරුණුය. මෙම කාර්යයන් පහසු කරවන ආකාරයට අධ්‍යයන පරිසරය නිර්මාණය කරන ලදී.

ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයේ කොටසක්වූ ඊජිප්තුව තුළ පුස්තකාලය, විශ්වවිද්‍යාලය, ස්වාභාවික ඉතිහාසයට අයත් වස්තූන්ගේ එකතුවක් සහිත කෞතුකාගාරය යන ගොඩනැඟිලි එක් ගොකට විද්‍යායතනයක් පිහිටුවීය. එය 'මියුසියම්' නමින් හඳුන්වනු ලැබීය.

සාපේක්ෂ දේශපාලන 7 පිටුවට

# ජාත්‍යන්තර තොරතුරු

## දකුණු අප්‍රිකානු කලාපය

### ඉතියෝපියාව

ඉතියෝපියාවේ මේ වන විට පවතින තත්ත්වය සම්බන්ධයෙන් පැහැදිලි නිගමනයක් ලබා ගැනීමට අපහසු තත්ත්වයක් පවතී. ජාත්‍යන්තර ක්ෂමා ආයතනය සහ 'හියුමන් රයිට්ස් වොච්' සංවිධානය දක්වන ආකාරයට ඉතියෝපියාවේ අම්හාරා ප්‍රදේශයේ ටිග්‍රේ ජනතාව ඝාතනය කිරීම්, සමූහ වශයෙන් සිරභාරයට ගැනීම් සහ පලවාහැරීම් ඉතියෝපියානු ආරක්ෂක අංශ විසින් වැඩි කර තිබෙනවා. මේ වන විට බටහිර ටිග්‍රේ ප්‍රදේශයේ ඉතියෝපියානු හමුදා සහ ටිග්‍රේ ජනතා විමුක්ති සංවිධානය අතර ගැටුම් හේතුවෙන් මිලියන 1.2 ක පමණ ජනතාවක් බලහත්කාරී ලෙස පලවාහැර හෝ පලා ගොස් ඇති අතර, නොවැම්බර් අග සතියේ පමණක් එලෙස පලවාහරින ලද හෝ පලා ගිය ජනතාවගේ සංඛ්‍යාව 10,000ක් පමණ වෙයි. තවමත් කඳුකර ප්‍රදේශ ටිග්‍රේ ජනතා විමුක්ති සංවිධානයේ පාලනය සහිතව පවතී. ජාත්‍යන්තර වශයෙන් තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ චීනය ඉතියෝපියානු රජයට සහාය දක්වන බවට වාර්තා වන අතර, රතු මුහුද ආශ්‍රිත රටක් වශයෙන් ඉතියෝපියාවේ ඇති වැදගත්කම ද, එක්සත් ජනපදය සමග ඇති ගැටුමේදී ඉතියෝපියාව මිත්‍ර පාර්ශවයක් වීමද මේ සඳහා හේතු විය හැක.

මේ වන විට ඉතියෝපියාවේ තත්ත්වය සම්බන්ධයෙන් බලපෑම්සහගත මැදිහත් වීමක් සිදුකළ හැකි රටවල් වශයෙන් මෙම රටවල් තුන පවතින අතර අප්‍රිකානු සංගමයට ද බලපෑම් කිරීමේ හැකියාව පවතී.

### සුඩානය

පසුගිය ඔක්තෝබර් මාසයේ සුඩානයේ අන්තර්කාලීන ආණ්ඩුවේ සිවිල් නායකත්වය නෙරපා සුඩානයේ හමුදාව බලය සියතට ගත්තේය. කෙසේ නමුත්, මේ වන විට අගමැති ධුරයෙන් නෙරපා දැමූ අබ්දාලා හම්දොක් නැවත ධුරයට පත් කර ඇත්තේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිත සමග නොවැම්බර් 21 වන දා ඇති කරගත් එකගතාවයක් අනුවය. මෙම හමුදා කුමන්ත්‍රණය හේතුවෙන් සුඩානය තුළ වර්ධනය වෙමින් තිබූ 7 පිටුවට



# චිලියේ ජනාධිපතිවරණය

දෙසැම්බර් 19 වන දින පවත්වන ලද චිලියේ ජනාධිපතිවරණය ඉතා තීරණාත්මක තරගයක්වූ අතර වාමාංශික කණ්ඩායම නියෝජනය කළ අපේක්ෂකයා සුවිශේෂී ජයග්‍රහණයක් ලබා ගත්තේයයය. ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා වූයේ අතිදක්ෂිණාංශික හොසේ ඇන්ටෝනියෝ කාස්ට් සහ වාමාංශික සන්ධානය නියෝජනය කළ ගේබ්‍රියල් බොරික් යන අයයි. පසුගිය මාසයේ පැවැති පළමු වටයේ ඡන්දවලින් ඇන්ටෝනියෝ කාස්ට් වැඩි ඡන්ද ප්‍රතිශතයක් (27.9 : 25.8) ලබාගෙන තිබුණත්, අවසන් ප්‍රතිඵලය තුළ ඉදිරියෙන් සිටීමට ගේබ්‍රියල් බොරික් සමත් විය. ඒ අනුව දෙවන වටයේ ඡන්ද ප්‍රතිඵල අනුව 56%ක ප්‍රතිශතයක් ලබා ගනිමින් ගේබ්‍රියල් බොරික් ජයග්‍රහණය කළේය. සංඛ්‍යාව අතින් ගත් විට එය මිලියන 4.6ක ඡන්ද සංඛ්‍යාවක්වූ අතර, මේ තාක් චිලිය තුළ ජයග්‍රාහී ජනාධිපතිවරණ අපේක්ෂකයකු ලබා ගත් වැඩිම ඡන්ද සංඛ්‍යාවත් එයයි. ගේබ්‍රියල් බොරික් 2022 වසරේ මාර්තු මස සිට ජනාධිපති ධුරයේ වැඩ ආරම්භ කරනු ඇත. මෙම වාමාංශික සන්ධානයට කොමියුනිස්ට් පක්ෂය සහ පුළුල් පෙරමුණ (Broad Front) ඇතුළත්ය. ගේබ්‍රියල් බොරික් සාමාජිකත්වය දරන 'සෝෂල් කන්වර්ජන්ස්' (Social Convergence) නමැති පක්ෂය මෙම පුළුල් පෙරමුණ (Broad Front) සමඟ සන්ධානගත වී සිටින පක්ෂයකි.

චිලියේ මේ තාක් පත් වූ ළාබාලතම ජනාධිපති ලෙස 35 හැවිරිදි බොරික් හැඳින්විය හැකිය. චිලියේ දකුණු කෙළවරේම පිහිටි පුන්ටා ඇරිනාස්හි උපත ලද බොරික් චිලියේ සන්තියාගෝහි චිලි විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය නායකයකු සහ ශිෂ්‍ය සටන්වල ක්‍රියාකාරිකයකු වශයෙන් 2011 වසරේ පැවැති අරගල තුළ ඉදිරියට පැමිණි අතර, 2014 වර්ෂයේදී ව්‍යවස්ථාදායකයට පත්වීමට අවස්ථාව හිමිකර ගත්තේය.

බොරික්ගේ ඡන්ද ව්‍යාපාරය තුළ සමාජ පරිවර්තනය, විශ්‍රාමික වැටුප් ක්‍රමය, LGBTQ සහ කාන්තා අයිතිවාසිකම්, දේශගුණික විපර්යාස කළමනාකරණය ආදිය කෙරෙහි අවධානය යොමු කරනු ලැබ තිබිණි. එසේම නව ලිබරල් ආර්ථික රටාව මුලිනුපුටා දැමීම ද ඔහුගේ මැතිවරණ ව්‍යාපාරයේ පොරොන්දුවක් විය. තවද පසුගිය කාලය තුල චිලිය කැලඹූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය සම්බන්ධයෙන් බොරික් පක්ෂපාතීව කටයුතු කළ අතර දක්ෂිණාංශික ඇන්ටෝනියෝ එයට විරුද්ධ විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බොරික් වෙත ඇති විශ්වාසය ද, තරුණ ප්‍රජාව තුළ ඔහු කෙරෙහි ඇති විශ්වාසය ද ඔහුට ඡන්දය තුළ වාසිසහගත තත්ත්වයක් අත්කර දීමට හේතු විය. වෙනිසියුලානු ජනාධිපති නිකොලස් මදුරෝ සහ චිලියේ හිටපු ජනාධිපති සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ වත්මන් මහ කොමසාරිස් වන මිචෙල් බැචලේ ද ප්‍රතිඵල නිකුත් වීමටද ප්‍රථම ගේබ්‍රියල් බොරික් වෙත සහයෝගය ප්‍රකාශ කළහ.

# යුක්රේනය සහ රුසියාව

යුක්රේනය සහ රුසියාව අතර අර්බුදය වසර කිහිපයක සිට පවතී. රුසියාව විසින් යුක්රේන දේශසීමාව ආශ්‍රිතව සහ රුසියානු ප්‍රදේශයක් ලෙස 2014 වර්ෂයේදී නම් කරන ලද ක්‍රිමියා ප්‍රදේශය ආශ්‍රිතව 1,00,000ක පමණ හට කණ්ඩායම් එවා ලබන වසර මුලදී ආක්‍රමණයක් සිදුකිරීමට අපේක්ෂා කරනු ලබන බවට එක්සත් ජනපදය චෝදනා කරන අතර, මෙම චෝදනා ප්‍රතික්ෂේප කරන රුසියාව එසේ ආක්‍රමණයක් කිරීමේ හැකියාවක් රුසියාව සතු වන නමුත්, එසේ කිරීමේ අරමුණක් රුසියාවට නැති බව ප්‍රකාශ කරයි. රුසියාව යුක්රේනය ආක්‍රමණය කිරීමට පියවර ගතහොත්, රුසියාව මත පෙර නොවූ විරූ සම්බාධක යෙදීමට සූදානම් බව යුරෝපා සංගමය ප්‍රකාශ කර ඇත. ජර්මනිය සහ එංගලන්තය ද මේ හා සමාන ප්‍රකාශ නිකුත් කර ඇත. මෙම තත්ත්වය බොහෝ දුරට බටහිර මාධ්‍ය මඟින් අනවශ්‍ය ලෙස හුවාදක්වමින් ගැටුමක් ලෙස වර්ධනය කර පෙන්වීමට දරන උත්සාහයක් වශයෙන්ද හඳුනාගත හැකිය.

2005 සහ 2014 වකවානු දෙකෙහි යුක්රේනය තුළ ගැටුම් වර්ධනයවූ අතර, රුසියාව සමඟ එක්වීමක් සිදු නොවී යුරෝපා සංගමය සහ නේටෝ සංවිධානය සමඟ යුක්රේනය ආර්ථික වශයෙන් සම්බන්ධ වීම එවායේ අවසන් ප්‍රතිඵලය විය. කෙසේ නමුත්, එක්සත් ජනපදය ප්‍රමුඛ නේටෝ සංවිධානය රුසියාව සමඟ තරගය සහ එදිරිවාදීභාවය පවත්වාගෙන යාමේදී යුක්රේනය වැදගත් සන්ධිස්ථානයකි. රුසියාවට යුක්රේන භූමියේ ඇති වැදගත්කමද එසේමය.

## හෙලනිස්තික ශිෂ්ඨාචාරය ....

4-5 පිටුවෙන්

සාමකාමීත්වයත්, අධිරාජ්‍යයේ ධනවත්කමත් විසින් හෙලනිස්තික යුගයේ විද්‍යාව දියුණු වීමට අවකාශ සලසනු ලැබීය. යටත්විජිත තුළින් ගලා ආ ධනයෙන් කොටසක් පර්යේෂණ කටයුතු සඳහා යොදවනු ලැබීය. ක්‍රිස්තු පූර්ව 323දී ඇලෙක්සැන්ඩර් අධිරාජයාගේ මරණින් පසු ඊජිප්තුව පාලනය කළ ටොලමි හා ටොලමි පරපුර අධ්‍යාපනයට හා විද්‍යාවේ ප්‍රගමනයට විශාල දායකත්වයක් දැක්වීය. පළමුවැනි ටොලමි විවිධ රාජ්‍යවලින් වියතුන් තම අගනුවරවූ ඇලෙක්සැන්ඩ්‍රියාවට කැඳවා ශාස්ත්‍රීය සහ පර්යේෂණ කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීය. එතෙක් ඇතැන්ස් පුරවරයට හිමිවූ ස්ථානය ක්‍රමයෙන් ඇලෙක්සැන්ඩ්‍රියාවට හිමි විය. පළමුවැනි ටොලමිගේ පුත් දෙවැනි ටොලමි සෝටර් බැබිලෝනියානු සම්ප්‍රදායය අනුගමනය කරමින්, ඇලෙක්සැන්ඩ්‍රියාවේ විශාල කෞතුකාගාරයක් තැනවීය. පුස්තකාලයක් ආරම්භ කර පොත් පත් රැස් කළේය. ඔහුගේ මරණය සිදුවන විට මෙම පොත් සංඛ්‍යාව ලක්‍ෂ දෙක ඉක්මවා තිබූ බව වාර්තා වේ. බැබිලෝනියාවෙන් පසු ඇතැන්ස් හෝ කිසිදු මධ්‍යස්ථානයක මෙබඳු දියුණු දැනුම් සම්භාරයක් එක්තැන්ව නොතිබිණි.

මෙම අවධියේම ඇලෙක්සැන්ඩ්‍රියාවට සමකාලීනව ඉතාලියේ සිසිලි දූපත (සිරාකූස්) කේන්ද්‍ර කරගෙන සහ ආසියා 'මයිනරයේ' (සුළු ආසියාවේ) සාමෝස් දූපත කේන්ද්‍ර කරගෙන තවත් විද්වත් මධ්‍යස්ථාන දෙකක් පැවැතිණි. ටොලමිගේ බලපෑම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ මෙම මධ්‍යස්ථාන තුන අතර ශීඝ්‍ර පණිවිඩ හුවමාරු සේවාවක් පැවැති බව සඳහන් වේ. මේ හේතුව නිසා සාමෝස්හි කරන ලද නව සොයාගැනීමක් **සිසිලියේ සිරාකූස්හි ආකිමිඩීස්ට රහසක් නොවූ බව පැවැසේ.** මේ නිසා ග්‍රීක දානික ගුරුකුලය අභාවයට ගොස් විවෘත ලෙස දැනුම හුවමාරු කර ගත් යුගයක් උදා විය. මෙය විද්‍යා ඉතිහාසයේ **'ඇලෙක්සැන්ඩ්‍රියා යුගය'** ලෙස හැඳින්වේ.

නව දැනුම සඳහා මෙම මධ්‍යස්ථාන අතර තරගකාරීත්වයක් පැවැති බවට මතයක් නිර්මාණයවී ඇත්තේ, දෙවැනි ටොලමි විසින් **ඇලෙක්සැන්ඩ්‍රියාවෙන් සාමෝස්හි පර්ගමම්** වෙත පැපිරස් අපනයනය තහනම් කිරීම නිසාය (එකල සියලු ලේඛන ලිවීමට යොදා ගනු ලැබූයේ තෘණ වර්ගයකින් තනා ගත් පැපිරස් පත්‍රිකාය). මේ සඳහා පර්ගමම් පුස්තකාලයේ ප්‍රතිචාරය වූයේ බැටලු හමින් කළ නව ලිපි ද්‍රව්‍යයක් හඳුන්වා දීමයි.

මෙම හෙලනිස්තික යුගයේ විශිෂ්ටතම විද්‍යාඥයන් වූයේ **ජ්‍යාමිතියේ මූලික සිද්ධාන්ත ඇතුළත් 'එලිමන්ට්ස්' ග්‍රන්ථය රචනා කළ යුක්ලිඩ්, සිරාකූස්හි ආකිමිඩීස් මෙන්ම පෘථිවියේ පරිධිය ගණනය කොට දිවා, රාත්‍රී සමව පවත්නා බව ප්‍රකාශ කළ භූගෝල විද්‍යාඥයකුවූ හෙරෝපිලස්, වෛද්‍ය විද්‍යාව සහ ශල්‍යකර්ම පිළිබඳ සොයාගැනීම් සිදු කළ එරසිස්ට්‍රාටුස් ආදීහුය.**

### ■ ශාස්ත්‍රීය දියුණුව

මෙම හෙලනිස්තික යුගයේදී ඇලෙක්සැන්ඩර් සහ අනුප්‍රාප්තිකයන් විසින් ග්‍රීක භාෂාව රජයේ නිල භාෂාව බවට පත් කරනු ලැබීය. එය සාහිත්‍යකරණයේදී යොදා ගත් භාෂාවද විය. මෙම යුගය සාහිත්‍යය අතින් විශාල දියුණුවක් හෝ නව හඳුන්වා දීම් දක්නට නොලැබුණත්, **ඊජිප්තුවේ ඉතිහාසය නැවත වරක් රචනා කළ මනෙතෝ සහ බැබිලෝනියාවේ ඉතිහාසය ලේඛනගත කළ බෙරෝස්සුස්** වැදගත්ය. මොවුන් දෙදෙනාම ග්‍රීක භාෂාව වෙනුවට නව භාෂාවක් යොදා ගත්හ.

එම යුගයේ රචිත පද්‍ය කෘතිවලට බොහෝ දුරට තේමාවන් වූයේ මිනිසාගේ චරිත ලක්‍ෂණ, ආගමික සහ දේශය පිළිබඳ හැඟීම්ය.

බොහෝ ගද්‍ය කෘතිවලට වස්තුවිෂය වූයේ පුද්ගල චරිතාපදානය. පෙරික්ලිස් යුගයේ මෙන් මහා සාහිත්‍ය කෘති බිහි නොවුණද, ග්‍රීක ස්වර්ණමය යුගයේ ලේඛන ආරක්‍ෂා කිරීම හෙලනිස්තිකවරුන් විසින් කරනු ලැබීය. පසුකාලීනව රෝම අධිරාජ්‍යයට මෙම ප්‍රදේශ යටත් වීමත් සමඟ ක්‍රමයෙන් ඇලෙක්සැන්ඩ්‍රියාවේ පුස්තකාලයද විනාශ විය.

## වායු බලශක්ති ප්‍රභව .....

03 පිටුවෙන්

### ජීව වායුව (Bio Gas)

ජීව වායුව යනු ප්‍රධාන වශයෙන් මීතේන් ($CH_4$) සහ කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) අඩංගු මිශ්‍රණයකි. කෘෂිකාර්මික අපද්‍රව්‍ය, සත්ව අපද්‍රව්‍ය, නාගරික අපද්‍රව්‍ය ආදී දේ උපයෝගී කරගනිමින් ජීව වායුව නිපදවනු ලබයි. ජීව වායුව යනු පුනර්ජනනීය බලශක්තියකි. ස්වභාවිකව ජීව වායුව නිපදවීම සිදුවන්නේ ක්‍ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වයක ප්‍රතිඵලයක් ලෙසිනි. කර්මාන්තයක් ලෙස ජීව වායුව නිපදවීමේදී ඒ සඳහා යෝග්‍ය ක්‍ෂුද්‍රජීවීන් යොදවා එම ක්‍රියාවලිය පහසු කිරීමේ පාරිසරික තත්වයන් සැපයීම සිදුකරනවා මෙන්ම තවත් විටෙක රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීම හරහා ද සිදුකරනු ලබයි.

තාපය ජනනය කිරීමට, ආහාර පිසීමට මෙන්ම විදුලිය නිපදවීමට ද ජීව වායුව භාවිතා කරනු ලබයි. එයින් කාබන්ඩයොක්සයිඩ් ඉවත්කර සම්පීඩනය කර **CNG** ලෙසද (සම්පීඩනය කරන ලද ස්වභාවික වායුව) භාවිතා කල හැක. ඒ හරහා වාහන පවා බලගැන්විය හැකි අතර බ්‍රිතාන්‍යයේ එලෙස බලගැන්විය හැකි ප්‍රමාණය සමස්ත වාහන ප්‍රමාණයෙන් 17%ක් පමණ වේ යැයි ගණන් බලා ඇත. එසේම ජීව වායු භාවිතාව හරහා එක්සත් ජනපදයේ හරිතාගාර වායු විමෝචනය 4%කින් අඩුකරගත හැකි යයි ද ගණනය කර ඇත.

## සුඩානය – ජාත්‍යන්තර තොරතුරු පිටුවෙන්

06 පිටුවෙන්

සිවිල් - හමුදා සට්ටනය ලෝකයට ඉස්මතුවී පෙනුණු අතර, ජාත්‍යන්තර බලපෑම් හමුවේ වුවද ඇතිවී තිබෙන එකඟතාවය පිළිබඳව මෙන්ම හමුදාව සමඟ කටයුතු කිරීම සම්බන්ධවද සිවිල් සංවිධාන සහ ජනතාව අවිශ්වාසයකින් සහ විරෝධයකින් සිටිති. එකඟතාවයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ යුතු සංශෝධන ඇතුළත් දේශපාලන ලියැවිල්ලක් සකස් කිරීම සහ විශේෂඥ කැබිනට් මණ්ඩලයක් නිර්මාණය කිරීම සිදුකළ යුතුව පවතී. පවතින තත්ත්වය හමුවේ සිවිල් සහ හමුදා නායකයන් අතර විශ්වසනීයත්වයක් ඇති කිරීම අභියෝගයක්ව පවතින අතර, රට තුළ තවත් බෙදීම් වර්ධනය වීමේ ඉඩක් පවතී. හමුදාවට පාලනයට සම්බන්ධ වීමට ඉඩදීම සම්බන්ධයෙන් සිවිල් ජනතාව සහ සිවිල් සංවිධාන විරෝධතා දක්වති. අගමැති හම්දොක් හමුදාව සමඟ එකඟතාවය ඇතිකරගැනීමට පක්ෂපාතී වීම සම්බන්ධයෙන්ද ජනතාව විරෝධය ප්‍රකාශ කරති. සිවිල් අගමැති නැවත පත්කිරීමෙන් අනතුරුවද පොලිසිය යොදා විරෝධතා දැක්වීම් මර්දනය කෙරෙමින් පවතී. එසේම රටට නැවත ජාත්‍යන්තර මූල්‍යමය සහ ආර්ථික ආධර ලබාගැනීමද සුඩානයට අභියෝගයක්ව පවතී. මේ වන විට 44කට ආසන්න පිරිසක් විරෝධතා දැක්වීම්වලදී ආරක්ෂක අංශ අතින් මිය ගොස් ඇත. 2023 වර්ෂයේ මැතිවරණයක් පවත්වා සිවිල් ආණ්ඩුවකට බලය පවරන බවටත්, හමුදාව දේශපාලනයෙන් ඉවත් වන බවටත් මේ වන විට හමුදා ප්‍රධානියා විසින් පොරොන්දුවක් ලබා දී තිබේ.

# සංස්කෘතිය යනු කුමක් ද?

**මිනිසා සංස්කෘතික සත්වයකු බව පිළිගත් පොදු මතයයි. ලෝකයේ ජීවත්වන සියලු ජීවීන් අතුරින් සංස්කෘතියක් ගොඩනඟා ගත්, සංස්කෘතික සම්බන්ධතා තුළ ජීවත්වන එකම සත්වයා ද වන්නේ මිනිසා ය. එය මිනිසා ලද ඓතිහාසික ජයග්‍රහණයකි. නමුත්, වර්තමානයේ මිනිසා අතීත සංස්කෘතික ලක්ෂණවල සිරකරුවකු බවට පත්වී හෝ සංස්කෘතික පිරිහීමක ගොදුරු බවට පත්වී හෝ සිටී. එය මානව සංහතියේ පැවැත්මට හිතකර වී නැත. සංස්කෘතිය සහ සමාජය පිළිබඳ නිවැරැදි කියැවීමක් අවශ්‍ය වන්නේ එබැවිනි. මෙම සාරාංශගත කෙටි ලිපිය ඒ වෙනුවෙනි.**

## සංස්කෘතිය යනු කුමක් ද?

සංස්කෘතිය පිළිබඳ සමාජයේ බොහෝ දෙනා තුළ ඇත්තේ, අසම්පූර්ණ අදහස් රැසකි. සංස්කෘතියේ සමස්ත අදහස එකඑල්ලේ, නිරවුල්ව ප්‍රකාශ කළ අදහසක් ලියොන් ට්‍රොට්ස්කි විසින් ඉදිරිපත් කර තිබේ. ඒ, "මිනිසාගේ සමස්ත ඉතිහාසය තුළදී සොබාදහම තුළින් දෙන ලද දෙයට පටහැනිව මිනිසා විසින් නිර්මාණය කරන ලද, උගන්නා ලද හා ජයග්‍රහණය කරන ලද සියල්ල සංස්කෘතිය වේ" යන්නයි. මාක්ස්වාදී දෘෂ්ටියට අනුව එය සරලව ගත් විට සිය ඉතිහාසය තුළ මිනිසා විසින් අත් කර ගන්නා ලද සියලුම ආධ්‍යාත්මික හා ද්‍රව්‍යමය වටිනාකම්වල එකතුව සංස්කෘතිය වේ.

## සංස්කෘතියේ විවිධත්වය ඒකත්වය තුළ

සංස්කෘතිය යනු එක් ප්‍රපංචයකි. සමස්ත මානව වර්ගයා විසින්ම ගොඩනඟන ලද දෙයකි. එහෙත්, එය ලොව පුරා පවතින්නේ එක හා සමාන ආකාරයකට නොවේ. එය රටෙන් රටට, විවිධ කලාපවලට, විවිධ කාලවලට අනුව ද විවිධත්වයක් පවතී. ඒ අනුව සංස්කෘතිය යනු විවිධත්වයේ ඒකත්වයකි. එමෙන්ම ඒකත්වයේ විවිධත්වයකි. සංස්කෘතියේ වටිනාකමත්, එහි අලංකරණයත්, සජීවී බවත් පවතින්නේ මෙම විවිධත්වය තුළ ය. සංස්කෘතිය මෙම විවිධත්වය සහිතව ඓතිහාසිකව පරිණාමය (වෙනස්වීම) ද වේ. සංස්කෘතිය විවිධ වර්ණවලින්, විවිධ රටාවලට අනුව අඳිනු ලබමින් පවතින නිම නොකළ සිතුවමක් බඳු ය.

මෙම සංස්කෘතික විවිධත්වයට හේතු වන ප්‍රධාන සාධක දෙකක් තිබේ.

1. නිෂ්පාදන උපකරණවල සංවර්ධනයේ මට්ටම හෙවත් සමාජ සංවර්ධනයේ මට්ටම.
2. විවිධ රටවල සහ විවිධ කලාපවල පවතින භූගෝලීය වෙනස්කම්.

විවිධ රටවල් තුළ පවතින නිවාස, ඇඳුම් පැළඳුම්, ආහාර රටා සහ චාරිත්‍රවල වෙනස්කම් ඇති වන්නේ මෙම පදනම මත ය.

## සංස්කෘතිය වෙනස්වන ප්‍රපංචයක් ලෙස

නිෂ්පාදන බලවේග එකතැන පවතින්නේ නැත. එය ලෝකයේ අන් සියල්ලම මෙන් අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී. ඊට අනුරූපව සමාජයද සර්පිලාකාර චලිතයක පවතී. ඊට අනුව සංස්කෘතිය ද වෙනස් වේ. පළමුව සංස්කෘතියේ භෞතික පාර්ශ්වය ද, ඊට අනුරූපව ම ආධ්‍යාත්මික පාර්ශ්වය ද දෙවනුව වෙනස් වේ.

## අතිපිරිසිදු සංස්කෘතියේ මිථ්‍යාව සහ සංස්කෘතික ආක්‍රමණ

ඉහතින් විස්තර කළ ආකාරයට සංස්කෘතිය එකතැන පවතින ඝනීභූත දෙයක් නොව නිතිපතා වෙනස් වන ගතික ප්‍රපංචයක් බැවින්, එය තව තව දේ එකතු කර ගන්නා අතරම අතීතයෙන් උරුමවූ පැරැණි දේද ඒ තුළ රඳවා ගනී. ඒ අතරම නව තත්ත්වයන්ට නොගැළපෙන පැරැණි දේ අභාවයට යවමින් වර්ධනය වේ. ඒ අනුව සංස්කෘතිය යනු අතීත ශ්‍රී විභූතිය පමණක් නොවන්නා සේම අතීතයෙන් තොර වර්තමානයක් ද නොවේ. එය අතීතය තමා තුළම ගැබ් කර ගත් වර්තමානය වේ. අතිපිරිසිදු සංස්කෘතියක් පිළිබඳව හෝ අතීත සංස්කෘතියක ශ්‍රී විභූතිය ගැන හෝ හඬාවැලපෙන්නේ මෙම සත්‍යය වටහා නොගත් අයයි. මානව සමාජයේ ඉතිහාසය තුළ දේපළ මත පන්ති සමාජය බිහිවූ දා සිට එය පිරී පවතින්නේ ආක්‍රමණවලිනි. දේපළ සහ භූමිය අත් කර ගැනීම සඳහා සිදු කරන ලද මෙම බොහෝ ආක්‍රමණවල මතුපිටින් ආගමික හා සංස්කෘතික වුවමනාවන් සම්බන්ධ කර තිබීම බොහෝ විට දැකිය හැකි ය. එමඟින් ආක්‍රමණයේ සැබෑ වුවමනාවන් සඟවා තබන ලදී. නිදසුන් ලෙස අතීත රෝම අධිරාජ්‍යය පැවැති අවධියේ යටත් කර ගත් රටවල රෝම සංස්කෘතිය තහවුරු කිරීමට ඔවුහු පියවර ගත්හ.

මෝගල් අධිරාජ්‍යය විසින් ඉන්දියාව යටත් කරන ලද විට ද, මෙම සංස්කෘතික ආක්‍රමණය සිදු විය. 'ටජ්මහල්' වැනි අගනා සංස්කෘතික සිහිවටන මෙන්ම ආගමික ගැටුම් සඳහා වූ බීජ ද එහි දායාදයන් විය. මෙම සංස්කෘතික ආක්‍රමණ සිදු වන්නේ ඍජු ආක්‍රමණ ලෙසට පමණක්ම නොවේ. සියුම් ලෙස හා වක්‍ර ලෙස සිදුවන ආක්‍රමණ ද තිබේ. ඒවා හඳුනා ගැනීම අපහසුය.

## සංස්කෘතික පරිහානිය සහ නිර්ධන පන්ති සංස්කෘතිය

සැබෑ ලෙසම සංස්කෘතික පරිහානිය යනු අතීතයේ පැවැති දේ (තමන් අගය කළ) වෙනස්වී තිබීම නොවේ. මානව සමාජයේ පැවැත්මට, එහි සංවර්ධනයට, මිනිසාගේ සාමූහික ක්‍රියාකාරීත්වයට සේවය කළ යුතු සංස්කෘතික ලක්ෂණ ඒ වෙනුවට ඒවාට බාධා කිරීමයි. නිදසුන් ලෙස මානව සමාජයේ සමඟියට, සාමූහිකත්වයට හානි කරන ආගමික, ජාතිකත්ව, වාර්ගික, ගෝත්‍රික ගැටුම් සංස්කෘතික පරිහානිය පෙන්වන ලක්ෂණ වෙයි. එය තනි තනි මිනිසාගේ වරදක් නොව ධනවාදයේ අර්බුදයේ සහ පරිහානියේ පිළිබිඹුවකි.

නිර්ධන පන්ති සංස්කෘතිය යනු දිළින්දන්ගේ සංස්කෘතිය නොවේ. එය ගොඩනැඟෙන්නේ දිළින්දන්ගේ දෘෂ්ටිය අනුව ද නොවේ. එය අනාගත දියුණු සමාජය නියෝජනය කරන සමාජ දෘෂ්ටිය වන නිර්ධන පන්ති දෘෂ්ටිය මත පදනම්ව ගොඩනැඟෙන සංස්කෘතික ලක්ෂණවලින් යුක්ත එකකි. ධනපති සමාජයක් තුළදී නිර්ධන පන්ති සංස්කෘතිය පොදු නිර්ධන පන්ති ජනයා තුළ පවතින්නේ නැත. ඒ වෙනුවට එය පවතින්නේ නිර්ධන පන්ති විප්ලවකාරී ව්‍යාපාරය තුළ ය.



විප්ලවවාදී නිර්ධන පන්තියේ දෘෂ්ටිය වශයෙන් මාක්ස්වාදය මුළු ලෝකයම සඳහා ඓතිහාසික වැදගත්කමක් දිනා ගත්තේ, ධනපති යුගයේ අගනා ජයග්‍රහණයන් කිසිවක් ඉවත ලීමෙන් නොව, ඊට හාත්පසින්ම ප්‍රතිකූල ලෙසින් මිනිස් චින්තනයේ හා සංස්කෘතියේ අවුරුදු දෙදහසකට අධික සංවර්ධනයේ ඇති වටිනා දේ සියල්ලක්ම ස්වීකර ගැනීමෙන් හා යළි හැඩගසා ගැනීමෙනි, නියම නිර්ධන පන්ති සංස්කෘතියක් සකස් කර ගැනීම ලෙසට පිළිගත හැක්කේ, සෑම ආකාරයකම සූරාකෑමට විරුද්ධව කරන අරගලයේ අවසාන අවධිය වන නිර්ධන පන්ති ආඥාදායකත්වයේ ව්‍යවහාරික අත්දැකීමෙන් පණ පෙවී මෙම පදනම මත හා මෙම දිසාවට ලක්කොට තව දුරටත් කරන වැඩකටයුතු පමණකි.

ලෙනින් තෝරාගත් කෘති, 11 වෙළුම - 78 පිටුව